# විමර්ශන නිලධාරී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

## MN – 04 - 2016


පළාත් පාලන දෙපාර්තමේන්තුව - දකුණු පළාත,

6 වන මහළ,

දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,

ගාල්ල.

අනුමත අංකය....163
දකුණු පළාත් ගරු....ආණ්ඩුකාරතුමා
විසින්.2022/06/28..දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු.....17.........කි.
2022/06/30

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

1.සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : පළාත් පාලන දෙපාර්තමේන්තුව (ද.ප.)
යොමු අංකය : CMA/03/07
දිනය : 2020.12.07

1.2 අමාත්‍යාංශය : පළාත් පාලන අමාත්‍යාංශය (ද.ප.)
යොමු අංකය : දිපස/ප්‍රඅ/සං/5/7
දිනය : 2020.12.17

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : 2013.01.01 දිනට අනුමත කාර්යය
දිනය : මණ්ඩල වාර්තාව

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය :
දිනය :

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NPC/12/77/2/14/SR
දිනය : 2021.12.21

1.6 දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය : යොමු අංකය : CSS/2/6/2/35
දිනය : 2022/04/27

1.7 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශය : යොමු අංකය : SP/PSC/12/07/05/බ.ග.ව.ජා.
දිනය : 2022/06/06

1.8 දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය : යොමු අංකය : G/SP/1/1/5/විවිධ/163
දිනය : 2022/06/28

2. පත් කිරීමේ බලධරයා

විමර්ශන නිලධාරී III, II සහ I තනතුරු සඳහා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් බලය පවරන ලද "අමාත්‍යාංශ ලේකම්" වේ.

ක්‍රියාත්මක වන දිනය :

ගරු ආණ්ඩුකාරවර අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3.සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරීන්

3.2 ශ්‍රේණි : III, II සහ I යනුවෙන් ශ්‍රේණි තුනකින් සමන්විත සේවක ව්‍යුහයක් සහිත සේවා ගණයකි.

3.3 පැවරෙන කාර්ය පිළිබඳ පොදු නිර්වචනය

පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්යයන් සාක්ෂාත් කර ගැනීමේ කාර්යයේදී විධායක කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට උපස්ථම්භක වන්නාවූ විමර්ශන තොරතුරු හා දත්ත රැස්කිරීම / විශ්ලේෂණය / සම්පාදනය, වාර්තා - සම්පාදනය,සමීක්ෂණය,උපදේශාත්මක සහායවීම ,මග පෙන්වීම වැනි කාර්යයන් ඇතුළත් නිශ්චිත කාර්යභාරයක් වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ ද කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි.

අනුමත අංකය 163
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමා
විසින් 2022/06/28 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 17 කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

3.4 කාර්යයන් පැවරීම

විමර්ශන නිලධාරී III , II සහ I ශ්‍රේණි

පළාත් පාලන ආයතනවල පරිපාලනය පිළිබඳ ව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම හා සම්බන්ධීකරණය කිරීම, අවශ්‍ය අවස්ථාවලදී පළාත් පාලන ආයතනවලට උපදෙස් ලබා දීම ,සහාය වීම හා මග පෙන්වීම සහ විමර්ෂණ කටයුතු සිදු කිරීම.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර , විශ්‍රාම වැටුප් සහිතය

05. වැටුප් ක්‍රමය

5.1 සේවා ගණය :ආශ්‍රිත නිළධාරී

5.2 තනතුරු නාමය :විමර්ෂණ නිළධාරී

5.3 වැටුප් කේත අංකය : MN 4 – 2016

5.4 මාසික වැටුප් පරිමාණය :

රු.31,490 – 10 x 445 – 11 x 660 – 10 x 730 – 5 x 750 – 54,250/=

5.5 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | රු.31,490 |
| II | පියවර 12 | රු.36,600 |
| I | පියවර 23 | රු.43,930 |

5.6.වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 විධිවිධානයන්ට අනුකූලව විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| විමර්ශන නිලධාරී | III, II, I | 25 (අවස්ථානුකූලව වෙනස්වීමට යටත්ය) | පළාත් පාලන ආයතනවල පරිපාලනය පිළිබඳ ව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා , පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීමට සහාය වීම හා සම්බන්ධීකරණය කිරීම, අවශ්‍ය අවස්ථාවලදී පළාත් පාලන ආයතනවලට උපදෙස් ලබා දීම ,සහාය වීම හා මග පෙන්වීම සහ විමර්ෂණ කටයුතු ඉටු කර වාර්තා ඉදිරිපත් කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : විමර්ශන නිලධාරී III, II සහ I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධව මුළු සේවක සංඛ්‍යාව 25 කි.

07.බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

අනුමත අංකය...... 163
දකුණු පළාත් ගරු...... ආණ්ඩුකාර්තුමා
විසින්.. 2022/06/28 ..දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු... 17 ...........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත .

7.2 විවෘත බඳවා ගැනීම

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීමෙන් අයදුම්පත් කැඳවා අයදුම්කරුවන් තරග විභාගයකට භාජනය කර එම විභාගයේ කුසලතාවය හා පවතින පුරප්පාඩු සැලකිල්ලට ගෙන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකින් පසු පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව බඳවා ගනු ලැබේ.

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : බඳවා ගනු ලබන්නේ ඉහත කී සේවා ගණයේ III ශ්‍රේණියට. පමණි

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ විෂය සහිත ව වාණිජවේදී උපාධිය හෝ කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ ගණකාධිකරණ උපාධිය හෝ ඒ හා සමාන යැයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන සුදුසුකම් තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් : දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05ක කාලයක් තුළ අනුගාමී වසර 03ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය තම ඡන්ද නාම ලේඛනයේ උද්ධෘත පිටපත් වලින් සනාථ කළ යුතුය.

(ඇ) පිට පළාතකින් පැමිණි අයදුම්කරුවෙකු නම් අයදුම්කරුගේ වසරක හා කලත්‍රයාගේ අනුගාමී වසර 03 ක දකුණු පළාත තුළ තම ස්ථිර පදිංචිය ඡන්ද නාම ලේඛනයේ උධෘත පිටපත් වලින් සනාථ කළ යුතුය

(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු අතර අධිකරණයකින් දඬුවම් ලැබූ අයෙකු නොවිම යුතුය.

(ඉ) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35ට නොවැඩි යුතුය.

අනුමත අංකය........163
දකුණු පළාත් ගරු... ආණ්ඩුකාරතුමා
විසින්..2022/04/28..දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු.....17..........කි.
2022/04/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.අභියෝග්‍යතා පරීක්ෂණය | 100 | 40 |
| 2. සාමාන්‍ය දැනීම | 100 | 40 |

7.2.4.1.1 පවත්වන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අපේක්ෂකයාගේ කායික/මානසික හැකියාව හා මූලික සුදුසුකම් පරීක්ෂා කෙරේ.ලකුණු ලබා දීමක් සිදු නොවේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : දකුණු පළාත් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීමෙන්

08.කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද වන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව /වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 3ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි (විෂය නිර්දේශය - උපලේඛන 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර 3ක් ගතවීමට පෙර. | ලිඛිත පරීක්ෂණයකි විෂය නිර්දේශය - උපලේඛන 02 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර 5ක් ගතවීමට පෙර. | ලිඛිත පරීක්ෂණයකි විෂය නිර්දේශය - උපලේඛන 03 |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : වසරකට දෙවරක් සැ.යු.
පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අදාල ශ්‍රේණියට පත්ව තිබීම අනිවාර්යය නොවේ.(ඕනෑම අවස්ථාවක ඉහත විභාගය සඳහා පෙනී සිටීමට හැකියාව ඇත.)

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්

අනුමත අංකය......163
දකුණු පළාත් ගුරු... ආණ්ඩුකාරතුමා
විසින්.2022/06/29.....දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු......17..........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

09. භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂාවකින් සේවයට පත්වූ නිලධාරියෙකු සේවයෙහි ස්ථිර කිරීමට පෙර එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1. 1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම

(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

(iv) උසස්වීම් දිනට පූර්වාසන්නම වසර පහ (05) තුළ සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

(v) අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම

(vi) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් ව තිබීම

10.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිළධාරීන් ,11 ශ්‍රේණියට උසස් කිරීමේ අයදුම් පත් පත්වීම් බලධාරියා වෙත නියමිත ආකෘතිය මගින් (උපලේඛන 4)ඉල්ලුම් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ. .

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම

(ii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

(iii) උසස්වීම් දිනට පූර්වාසන්නම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

(iv) නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් ව තිබිය යුතුය

10.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිළධාරීන් ,1 ශ්‍රේණියට උසස් කිරීමේ අයදුම් පත් පත්වීම් බලධාරියා වෙත නියමිත ආකෘතිය මගින් (උපලේඛන 4)ඉල්ලුම් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ. .

11. තනතුරු වලට පත් කිරීම : අදාළ නොවේ.

අනුමත අංකය.....163
දකුණු පළාත් ගරු.....ආණ්ඩුකාර්තුමා
විසින්.2022/06/28..දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු.....17.........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, දකුණු පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල දකුණු පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතු ය.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර වෙතින් විමසා කටයුතු කරනු ඇත.

13.1 "බඳවා ගැනීමේ පරිපාටිය" යනුවෙන් අදහස් වනුයේ දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය වේ.

13.2"ආණ්ඩුකාරවර " යනුවෙන් අදහස් කරනුයේ දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර වේ.

13.3 "ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් වේ.

13.4 "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

13.5 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වේ

13.6 "කොමිෂන් සභාව " යනුවෙන් අදහස් කරනුයේ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ

13.7 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ දකුණු පළාත් , පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වේ.

13.8 "සතුටුදායක සේවා කාලය" යනු රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත් වීම මගින් ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.9 "සක්‍රිය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේ ය.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය
සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම (නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ)

නව බඳවා ගැනීම් පරිපාටිය / සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) මගින් ලබා දී ඇති MN 4 2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයන් සියලු දෙනාම එකී දින වන විට ලබා සිටි ශ්‍රේණිය පදනම් කො ට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන වලට යටත් ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත

යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වතුදු, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති දිනය වශයෙන් නොවෙනස් ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන්

අනුමත අංකය 163
දකුණු පළාත් ගුරු ...
විසින් 2022/06/28 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු 17 කි.
2022/06/30

වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතු ය.

i. MN 4 - III ශ්‍රේණිය(උපලේඛන 5 අනුව අන්තර්ග්‍රහණ අයදුම්පතක් ඉදිරිපත් කල යුතුය)

(අ) MN 4 2016 වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

(ආ) III ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ වුව ද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය සෙසු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

MN 4 - III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. MN 4 - II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 කට නොඅඩු එහෙත් අවුරුදු 20 කට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්,

(ආ) MN 4 2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක සේවා කාලය වසර 10 සම්පූර්ණ වුව ද, I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා නොමැති නිලධාරීන්,

MN 4 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

iii. MN 4 - I ශ්‍රේණිය(උපලේඛන 5 අනුව අන්තර්ග්‍රහණ අයදුම්පතක් ඉදිරිපත් කල යුතුය)

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති සේවා ව්‍යවස්ථාව / බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්,

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 10 ක සේවා කාලයක් ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සහ ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති නිලධාරීන්,

(ඇ) MN 4 2016 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන නිලධාරීන්,

MN 4 - I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

අනුමත අංකය.....163
දකුණු පළාත් ගරු......ආණ්ඩුකාරතුමා
විසින්...2022/06/28...දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු.......17.........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

15. අන්තර් කාලීන විධිවිධාන

15.1 සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සෑම නිලධරයෙකුම ව්‍යවස්ථාවේ 8.1 යටතේ දැක්වෙන පරිදි අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා ව්‍යවස්ථාව බලාත්මක වන දින සිට වසර 03ක සහන කාලයක් හිමිවේ.අදාල ශ්‍රේණියේ වැටුප් පියවර ඉක්මවා ඇති නිළධාරීන් කාර්යක්ෂමතා කඩ ඉමෙන් නිදහස් කරනු ලැබේ.

15.2 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මක ව පැවැති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අමාත්‍යාංශ ලේකම්ගේ සහතිකය මත නිදහස් කර ඇති නිලධාරීන් හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් ව ඇති නිලධාරීන් මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමේදී පිළිවෙලින් පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

15.3 මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් විධිවිධාන පරිදි පෝෂ්‍ය විමර්ශන නිලධාරීන් ලෙස උසස් කර I ශ්‍රේණියේ වැටුපෙහි පිහිටුවා ඇති නිලධාරීන්ගේ <u>තනතුරු නාමය පමණක්</u> ඔවුන්ට පෞද්ගලික වනසේ පෝෂ්‍ය විමර්ශන නිලධාරීන් ලෙස තවදුරටත් හඳුන්වනු ලැබේ. මේ අනුව ඔවුන් පිහිටුවා ඇති වැටුප් පරිමාණයෙහි හෝ වැටුපෙහි කිසිදු වෙනසක් ඇති නොවේ.

(ඉහත 15 .3අනුව උසස්වීම් ලද අය උපලේඛන 5 අනුව අන්තර්ග්‍රහණ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල යුතුය)

16. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු

මෙම බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය වන්නේ නම් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසිය හැකි අතර, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ : අත්සන : ..............................

එම්.ජේ.එච්. ආශ්මරී
ප්‍රධාන කළමනාකරණ සහකාර,
පළාත් පාලන කොමසාරිස්
දකුණු පළාත.

පරීක්ෂා කළේ : ..............................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

ඩී. එච්. හීරෝෂා
පරිපාලන නිලධාරී
පළාත් පාලන කොමසාරිස් වෙනුවට
පළාත් පාලන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම : ..............................
තනතුර : ..............................
දිනය : 2022.2.28
නිල මුද්‍රාව : ..............................

සේනක සල්පිටියගුරුගේ
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

යොමු අංකය : ..............................

18. , අමාත්‍යාංශය ලේකම්ගේ නිර්දේශය

දකුණු පළාත් සභාවෙ........ හි ...විමර්ශන නිලධාරී...........

තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................
නම : ..............................
තනතුර : ලේකම්, අමාත්‍යාංශය
දිනය : ..............................
නිල මුද්‍රාව : 22/3/4

ප්‍රසන්න ඩබ්ලිව්. මහේන්ද්‍ර,
ලේකම්
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය
පළාත් පාලන, ප්‍රවාහන සහ සංචාරක අමාත්‍යාංශය
5 වන මහල, "දක්ෂිණායන" අමාත්‍යාංශ සංකීර්ණය
ලබුදූව, ගාල්ල.

යොමු අංකය : ..............................

අනුමත අංකය......163
දකුණු පළාත් ගරු......ආණ්ඩුකාරතුමා
විසින්.2022/04/28..දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු......17......කි.
2022/04/30
ආණ්ඩුකාර ලේකම්

19 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය,

......දක්ෂිණ ............................................හි ........................................තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ........................................

නම : ..ආර්. සී. ද. සොයිසා......

තනතුර : . ප්‍රධාන ලේකම්,

දිනය : ..2022/04/27........

නිල මුද්‍රාව : ........................................

යොමු අංකය : ........................................

ආර්. සී. ද. සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

20. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව අනුමත කරමි.

| | | | |
|---|---|---|---|
| 1. | ජී.හේවාවිතාරණ මයා | (සභාපති) | --------------- |
| 2. | දයාපාල ඩබ්.විතාරණ මයා | (සාමාජික) | --------------- |
| 3. | කේ.කේ.ජී.ජේ.කේ.සිරිවර්ධන මයා | (සාමාජික) | --------------- |
| 4. | එස්.විජේසේකර මයා | (සාමාජික) | --------------- |
| 5. | සුනිල් දහනායක මයා | (සාමාජික) | --------------- |
| 6. | එම්.හාල්පන්දෙණිය මයා | (සාමාජික) | --------------- |
| 7. | එල්.කේ.ආරියරත්න මයා | (සාමාජික) | --------------- |

21. ආණ්ඩුකාරවර ලේකම්,

2022/05/18 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 17 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන විමර්ශන නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2022/06/06

----------------------------------------
ලේකම්
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගාමිණී වීරවික්‍රම
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

අනුමත කරමි/නොකරමි.

----------------------------------------
දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර

දිනය 2022.06.28

ආචාර්ය ඩබ්ලිව්.ඩබ්ලිව්.ගමගේ
ආණ්ඩුකාරවර
දකුණු පළාත

අනුමත අංකය 163
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා විසින් 2022/06/28 දින අනුමත කොට ඇති බව සහතික කරමු. පිටු 17 කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

උපලේඛන - 01

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : III වන ශ්‍රේණියට බඳවාගෙන වසර 3ක් ගතවීමට පෙර

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍ර | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. කාර්යාල ක්‍රම | පැය 02 | 100 | 40 |
| 02. ගිණුම් කටයුතු | පැය 01 | 100 | 40 |
| 03. විෂයානුබද්ධ කරුණු | පැය 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. කාර්යාල ක්‍රම | • රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ XII,XIV,XVI,XVIII,XIX,XXIV පරිච්ඡේද හා රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ සාමාන්‍ය දැනුම |
| 02. ගිණුම් කටයුතු | 1. වියදම් හා ඇස්තමේන්තු<br>• ඒකාබද්ධ අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩසටහන් සකස් කිරීම<br>• වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම<br>• වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම/ඉදිරිපත් කිරීම/සම්මත කිරීම<br>• වියදම් ඇස්තමේන්තුවල වෙනසක් කිරීම<br>2. සැලසුම් වැඩ හා සේවා<br>• ප්‍රසම්පාදන කටයුතු<br>• සැපයුම්<br>• භාණ්ඩවල භාරය හා හරි වැරදි බැලීම<br>• වැඩ හා සේවා<br>• නියමයෙන් බැහැරවීම සඳහා අධිකාරී බලය<br>• විවිධ කරුණු |
| 04. විෂයානුබද්ධ කරුණු | පළාත් පාලනය පිළිබඳ ව්‍යවස්ථාපිත නීතිය. |

අත්සන.......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : සේනක පල්ලියගුරුගේ
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : 2022.2.28
නිලමුද්‍රාව :
සේනක පල්ලියගුරුගේ
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

අනුමත අංකය......163
දකුණු පළාත් ගරු......ආණ්ඩුකාරතුමා
විසින්..2022/04/28..දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු.....17.........කි.
2022/04/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

උපලේඛන - 02

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : II වන ශ්‍රේණියට උසස්වී වසර 3ක් ගතවීමට පෙර.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍ර | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01.ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | පැය 02 | 100 | 40 |
| 02. මුදල් රෙගුලාසි හා දකුණු පළාත් මූල්‍ය රීති | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම | • ආයතන සංග්‍රහයේ VI,VII,IX,XI,XXIII,XXV,XXVI,XXVII,XXVIII,XXIX, XXX,XXXI,XXXII,XXXIII,XLVII,XLVIII පරිච්ඡේද හා රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳ සාමාන්‍ය දැනුම |
| 02. මුදල් රෙගුලාසි හා දකුණු පළාත් මූල්‍ය රීති | 2.1. රජයේ අරමුදල් හා ඒවා පාලනය වන ආකාරය<br>• ඒකාබද්ධ අරමුදල හා වෙනත් අරමුදල් ස්ථාපනය වී ඇති ආකාරය<br>• පාර්ලිමේන්තුවේ හා භාණ්ඩාගාරයේ පාලනය<br><br>2.2. ඒකාබද්ධ අරමුදල් වලින් මුදල් වියදම් කිරීම<br>• සැපයුම්, සේවා හා විශේෂ කටයුතු<br>• ඇස්තමේන්තු පිළිබඳ ක්‍රියා පරිපාටි හා සැලැස්ම<br>• පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්<br>• නව යෝජනා<br>• සංකේත ප්‍රතිපාදන<br>• සාමූහික ප්‍රතිපාදන<br>• විසර්ජන පනත<br>• පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම<br>• වොරන්ට් බලපත්‍ර<br>• අග්‍රිමය අධිකාරී බලය<br>2.3. ඒකාබද්ධ අරමුදලේ රාජ්‍ය ආදායම<br>• රාජ්‍ය ආදායම් යන්නෙහි අර්ථ නිරූපනය කිරීම<br>• රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු ආකෘතිය<br>• රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම හා ඒවා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම |

අනුමත අංකය...163
දකුණු පළාත් ගරු...ආණ්ඩුකාරතුමා
විසින්.2022/04/28....දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු....17.........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්

2.4. අත්තිකාරම් ගිණුම යටතේ කෙරෙන කටයුතු
- අත්තිකාරම් ගිණුම් වර්ග
- අත්තිකාරම් ගිණුම් වර්ග වල විෂය පථය හා සේවා
- සීමාවන් වෙනස් කිරීම
- නව අත්තිකාරම් ගිණුම් ඇති කිරීම
- තබාගත යුතු ගිණුම් පොත්
- අත්තිකාරම් ගිණුම් වලට අදාල ප්‍රාග්ධන වියදම්
- අත්තිකාරම් ගිණුම් වල වාර්ෂික අවසාන ගිණුම් හා ශේෂ පත්‍ර
- අත්තිකාම් ගිණුම් කටයුතු ගනුදෙනු පියවා වසා දැමීම
- ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය

2.5. රජයේ මුදල් පාලනය
- ගණන් දීමේ නිලධාරී, ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා රාජ්‍ය අදායම් පිලිබඳ ගණන් දීමේ නිලධාරී
- ඔවුන්ගේ වගකීම හා බලතල පැවරීම
- අභ්‍යන්තර විගණනය
- විගණකාධිපතිගේ, භාණ්ඩාගාරයේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ කාර්ය භාරය

2.6. පාඩු හා අතහැර දැමීම

2.7. තැන්පත් ගිණුම

2.8. රජයේ මුදල් වල ආරක්ෂාව පිළිබඳ කාර්ය පරිපාටිය, සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම් හා අගරු කළ චෙක්පත්

2.9. දකුණු පළාත් මූල්‍ය රීති

අත්සන.........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : සේනක පල්ලියගුරුගේ
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : 2022. 2. 28
නිලමුද්‍රාව :
සේනක පල්ලියගුරුගේ
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

අනුමත අංකය....163
දකුණු පළාත් ආණ්ඩුකාරතුමා
විසින් 2022/04/28 දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු....17....කි.
2022/04/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

උපලේඛන - 03

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගයේ / වෘත්තීය පරීක්ෂණයේ නම : තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය / වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර : I වන ශ්‍රේණියට උසස්වී වසර 5ක් ගතවීමට පෙර.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍ර | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 1/2 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. පොදු ප්‍රශ්න පත්‍රය | I. කිසියම් ප්‍රකාශයක් හෝ සටහනක් කියවා අවබෝධ කොටගෙන ලිපියක් හා / හෝ වාර්තාවක් පිළියෙළ කිරීම<br>II. කාලීන සමාජීය සිදුවීම් පිළිබඳව අවබෝධ කොටගෙන විග්‍රහ කර දැක්වීම පිළිබඳ හැකියාව මැනීම |

අත්සන..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : සේනක පල්ලියගුරුගේ
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : 2022.2.28
නිලමුද්‍රාව : සේනක පල්ලියගුරුගේ
පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව
දකුණු පළාත.

අනුමත අංකය......163
දකුණු පළාත් ගරු.... ආණ්ඩුකාරතුමා
විසින්.2022/06/28.....දින අනුමත කොට ඇති බව
සහතික කරමු.අපි.....17.........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත .

උපලේඛන - 04

## <u>දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ෂණ නිළධාරී 11/1ශ්‍රේණි උසස් වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත</u>

1. නිලධරයා පිළිබඳ තොරතුරු
   1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ...............................................................................
   1.2 හැඳුනුම්පත් අංකය : ...............................................................................
   1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ...............................................................................
   1.4 අයත්වන සේවය හා තනතුර : ...............................................................................
   1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ...............................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු
   2.1 පත්වීම් දිනය : ...............................................................................
   2.2 පත්වීම ස්ථිර කළ දිනය : ...............................................................................
   2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාල තොරතුරු
   3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I
   3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

   3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද ? ඔව් / නැත
   3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ...............................................................
   3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේ ද ? ඔව් / නැත
   3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේ ද? ඔව් / නැත

   3.2.5 උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද ? ඔව් / නැත

   3.2.6 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

4 අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ...................................... දින සිට II / I ශ්‍රේණියට උසස් වීමට අදාල සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : .................................. ..................................
නිලධරයාගේ අත්සන

අනුමත අංකය......163......
දකුණු පළාත් ගරු......ආණ්ඩුකාරතුමා......
විසින්.....2022/04/28.....දින අනුමත කොට ඇති බව
සහතික කරමු පිටු.......17.......කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

5 <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් ................................... මහතා / මෙනෙවිය / මහත්මිය .....................................................සේවා ගණයේ ............................ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

| | | |
|---|---|---|
| අත්සන | : | ...................................... |
| නම | : | ...................................... |
| තනතුර | : | ...................................... |
| දිනය | : | ...................................... |
| නිලමුද්‍රාව | : | ...................................... |

6 <u>අමාත්‍යාංශ ලේකම් / පත්වීම් බලධරයා</u>

ඉහත සඳහන් සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව .................................................... මහතා / මෙනෙවිය / මහත්මිය ................................. සේවා ගණයේ ................................ ශ්‍රේණියට....................................... දින සිට උසස් කිරීම අනුමත කරමි.

| | | |
|---|---|---|
| අත්සන | : | ...................................... |
| නම | : | ...................................... |
| තනතුර | : | ...................................... |
| දිනය | : | ...................................... |
| නිලමුද්‍රාව | : | ...................................... |
| | | ( පත්වීම් බලධරයා) |

අනුමත අංකය......163
දකුණු පළාත් ගරු....ආණ්ඩුකාරතුමා
විසින්.2022/04/28.....දින අනුමත කොට ඇති බව
සහතික කරමු.පිටු.....17..........කි.
2022/04/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

උපලේඛන - 05

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශණ නිළධාරීන් නව සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය සඳහා වූ අයදුම්පත්‍රය

### 1. කොටස-අයදුම්කරු විසින් සම්පූර්ණ කල යුතුය

1. සේවා ස්ථානයේ ලිපිනය ------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------

2.අයදුම්කරුගේ සම්පූර්ණ නම ------------------------------------------------------------------------------

--------------------------------------------------මෙය/මහතා/මහත්මිය

3. I. උපන් දිනය 3.II. සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මකවන දිනට වයස

4. දැනට දරන තනතුර ------------------------------------------------------------------------------

5. පත්වීමේ ස්වභාවය

5.1 තනතුරට අදාල මුල් පත්වීම් දිනය ------------------

5.2 පත්වීම් ස්ථිර කල දිනය හා ලිපියේ අංකය ------------------

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව

6.1. වැටුප් පරිමාණය -------------------

6.2. වැටුප් කේත අංකය --------------------

6.3. දැනට ලබන වැටුප් පියවර --------------------

7. දැනට දරණ තනතුරට බඳවා ගනු ලැබීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් ------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------

8.රාජකාරි විස්තර(සැකැවින්) ------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------

9. දැනට දරණ තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනිමේ පටිපාටියට අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණ සමත්වූ දිනයන්

| කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය | සමත්වූ දිනයන් |
|---|---|
| ------------------------------------ | ----------------- |
| ------------------------------------ | ----------------- |
| ------------------------------------ | ----------------- |

10.සේවා කාලය පිළිබඳව විස්තර

| සිට | දක්වා | තනතුර | සේවා ස්ථානය | සේවා කාලය(අවු) |
|---|---|---|---|---|
| | | | | |

11.ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය අයදුම්කරුගේ අත්සන

අනුමත අංකය........163
දකුණු පළාත් ගරු........ආණ්ඩුකාරතුමා
විසින්..2022/06/28..දින අනුමත කොට ඇති බව
සහතික කරමු. පිටු.......17.........කි.
2022/06/30
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

2 කොටස -ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය

12. අයදුම්කරු විසින් ඉහත 1-10 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදිය.ඔහු/ඇය ................................ලෙස..................................දින සිට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

13. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ඔහු/ඇය.......................................................ලෙස...........................දින සිට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නොකරමි.

අත්සන .......................................
නම ............................................
තනතුර ..........................................
දිනය ........................................ නිලමුද්‍රාව ............................................

14. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නිර්දේශය

අයදුම්කරු /අයදුම්කාරිය .......................................................ලෙස...........................දින සිට අන්තර්ග්‍රහණය කිරීම අනුමත කරමි

අත්සන .......................................
නම ..........................................
තනතුර ..........................................
දිනය ........................................ නිලමුද්‍රාව .......................................